සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවProvincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 07 ශ්‍රේණිය - 2023
## Second Term Test - Grade 07 - 2023

## නාට්‍ය හා රංග කලාව - I

කාලය පැය 02 යි

නම / විභාග අංකය:

- 1 සිට 20 දක්වා සියළුම ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. ශ්‍රව්‍ය මාධ්‍යයක් වන්නේ,
    1. රූපවාහිනිය 2. ගුවන් විදුලිය 3. වේදිකා නාට්‍ය 4. පුවත් පත

02. පරිසරයේ දැකිය හැකි ස්වභාවික සංසිද්ධියකි.
    1. පොල් රුප්පාවට සඳ එළිය වැටීම 2. මුහුදේ නැවක් ගමන් කිරීම
    3. සරුංගලයක් අහසේ පාවීම 4. වැව් දිය මත පාවෙන ඔරුවක්

03. පාලිත ලොකුපෝතාගම මහතාගේ නාට්‍යයක් වන්නේ,
    1. පුංචි අපිට දැන් තේරෙයි 2. ඩුං ඩුං බෙරේ
    3. අමර ගියා දිව්‍ය ලෝකෙ 4. වලහා හා මාෂා

04. සංවාද භාවිතයෙන් තොරව ඉදිරිපත් කරන රංගනයකි,
    1. අභිරූපන 2. චරිත නිරූපන 3. කෙටි නාට්‍ය 4. ක්ෂණික නිරූපන

05. නූර්ති ගීයක් වන්නේ,
    1. ඇහැළ මලින් ගස් පිරිලා 2. දීකිරි දීකිරි ගෙනාවා දීකිරි
    3. ඕලු නෙළුම් නෙරිය රඟාලා 4. සුවඳ පද්ම ඕලු ආදි

06. හඬ අභ්‍යාස සඳහා යොදාගත හැකි ග්‍රන්ථයකි,
    1. සිරිත් මල්දම 2. නම් පොත 3. සුභාෂිතය 4. ජාතක කථා පොත

07. සාමූහික ක්ෂණික නිරූපනයක් සඳහා සුදුසු මාතෘකාවක් වන්නේ,
    1. කැදර ළමයෙක් 2. ශාස්ත්‍ර කාරියක් 3. මඟුල් ගෙදරක් 4. කපටි හිඟන්නෙක්

08. වැලි මිරිකා දිය ගෙන හැර දැක්වූ රජු වන්නේ,
    1. කාවන්තිස්ස රජු 2. රාජසිංහ රජු 3. බුද්ධදාස රජු 4. ගජබා රජු

09. පරිකල්පන අභ්‍යාසයක් වන්නේ,
    1. වෙද පුටුව 2. හිම කන්ද දියවීම 3. එළුවන් කෑම 4. බැලුනයකට හුලං ගැසීම.

10. අමර ගියා දිව්‍ය ලෝකේ නාට්‍යයේ සිරින්ජය,
    1. වේදිකා සැරසිල්ලකි. 2. රංග භාණ්ඩයකි. 3. අංග රචනයකි. 4. බිත්ති සැරසිල්ලකි.

- **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්න වල ඇති හිස්තැන් වරහන් තුළ යොදා ඇති වචන උපයෝගී කරගෙන පුරවන්න. (පරිකල්පනය / වාචික අභිනය / සිරි පැරකුම් / තේමාව / කට හඬ අභ්‍යාස)**

11. .............................................. ඓතිහාසික සිද්ධියක් පදනම් කරගත් චිත්‍රපටියකි.
12. අලුතින් යමක් සිතීම ....................................................... ලෙසින් හැඳින්වේ.
13. නාට්‍යකට යොදාගන්නා ගීත ගායනා ............................................................... අයත් වේ.
14. නාට්‍යයකින් කියවෙන මූලික අදහස ....................................................... නම් වේ.
15. බුද්ධ ගජ්ජය ....................................................... සඳහා යොදාගත හැකි ග්‍රන්ථයකි.

- **අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු හරි නම් ( √ ) ලකුණ ද, වැරදි නම් ( × ) ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.**

16. වේදිකා නාට්‍යයක දී දැකිය හැකි සජීවී ගුණය රූපවාහිනී නාට්‍යයක දැකිය නොහැක. (    )
17. 'ඇහැට කණට' ගුවන් විදුලියෙන් විකාශනය වන වැඩ සටහනකි. (    )
18. කතාන්දර යොදාගෙන නාට්‍ය පෙළක් නිර්මාණය කළ හැක. (    )
19. සිරිත් මල්දම නාට්‍ය නිර්මාණය සඳහා නුසුදුසු ග්‍රන්ථයකි. (    )
20. කොළපත්, ආනුශාංගික කලා නිර්මාණය සඳහා පරිසරයෙන් සොයාගත හැකි අමුද්‍රව්‍යයකි. (    )

---

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න දෙකක් ඇතුළත් වන සේ ප්‍රශ්න 03කට පිළිතුරු සපයන්න.**

01. i. අමර ගියා දිව්‍ය ලෝකෙ නාට්‍යයේ රචකයා කවිද? (ල. 02)
 ii. එහි එන චරිත දෙකක් ලියන්න. (ල. 02)
 iii. එම නාට්‍යයේ භාවිතා කරන රංග භාණ්ඩයක් නම් කරන්න. (ල. 02)
 iv. එම නාට්‍යයේ සිටින මිනිස් නොවන චරිතයක් නම් කරන්න. (ල. 02)
 v. එම නාට්‍යයේ තේමාව ලියා දක්වන්න. (ල. 02)

02. i. රංග අභ්‍යාස යනුවෙන් හඳුන්වන්නේ කුමක් ද? (ල. 02)
 ii. රංග අභ්‍යාස 03ක් නම් කරන්න. (ල. 03)
 iii. ඔබ ප්‍රායෝගිකව කරන ලද රංග අභ්‍යාසයක නියැලෙන අයුරු විස්තර කරන්න. (ල. 05)

03. i. ඔබ නැරඹූ නාට්‍යයක භාවිතා කළ අනුශාංගික කලා 02ක් නම් කරන්න. (ල. 02)
 ii. නාට්‍යයක ආනුශංගික කලා සැකසීමේ දී අනුගමනය කළ යුතු කරුණු 03 ක් ලියන්න. (ල. 03)
 iii. නාට්‍යයක ආනුශංගික කලා නිර්මාණය සඳහා පරිසරයෙන් සොයාගත හැකි අමුද්‍රව්‍ය ලැයිස්තුවක් සකස් කරන්න. (ල. 05)

04. i. ක්ෂණික නිරූපන යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද? (ල. 02)
 ii. ක්ෂණික නිරූපනයක දක්නට ලැබෙන ලක්ෂණ 03ක් ලියන්න. (ල. 03)
 iii. ඒකල හා සමූහ ක්ෂණික නිරූපන මාතෘකා 02 බැගින් ලියන්න. (ල. 05)

05. ඔබ දන්නා ජන කථාවක් ඇසුරින් නාට්‍යයකට සුදුසු පෙළක් නිර්මාණය කරන්න.
 i. චරිත සංවාද සහිත පෙළ නිර්මාණය සඳහා (ල. 05)
 ii. කුතුහලය ගැටුම් හා අවසානය සහිත පෙළ නිර්මාණය සඳහා (ල. 05)

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**Provincial Department of Education - NWP**

**දෙවන වාර පරීක්ෂණය - 07 ශ්‍රේණිය - 2023**
**Second Term Test - Grade 07 - 2023**

**නාට්‍ය හා රංග කලාව - ප්‍රායෝගික පරීක්ෂණය**

01. අමර ගියා දිව්‍ය ලෝක නාට්‍යයේ එක් චරිතයක් රඟපෑමට (ල. 10)

02. පහත සඳහන් වචන අර්ථ 03ක් වන සේ උච්චාරණය කරන්න.

    i. මට බෑ ii. මෙහාට එන්න
    iii. අඬන්න එපා iv. දැන් හරි (ල. 10)

03. ජන කතාවක් නාට්‍යානුසාරීව ඉදිරිපත් කරන්න. (ල. 10)

04. නාට්‍ය ගීතයක් ගායනා කරන්න. (ල. 10)

05. පහත සඳහන් මාතෘකා උපයෝගී කරගෙන සාමූහික ක්ෂණික නිරූපනයක් කරන්න. (ල. 10)

    1. බස් රථයක් තුළ තදබදයක්
    2. මනමාලයා නොපැමිණි මඟුල් ගෙදර
    3. මළ ගෙදරක අවස්ථාවක්
    4. සත්තු වත්ත

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 07 ශ්‍රේණිය - 2023
## Second Term Test - Grade 07 - 2023

# නාට්‍ය හා රංග කලාව

පිළිතුරු පත්‍රය

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 01. | 2 | 06. | 2 | 11. | සිරි පැරකුම් | 16. | √ |
| 02. | 1 | 07. | 3 | 12. | පරිකල්පනය | 17. | × |
| 03. | 3 | 08. | 4 | 13. | වාචික අභිනය | 18. | √ |
| 04. | 1 | 09. | 1 | 14. | තේමාව | 19. | × |
| 05. | 4 | 10. | 2 | 15. | කටහඬ අභ්‍යාස | 20. | √ |

II කොටස

01. i. පාලිත ලොකුපෝතාගම මහතා (ල. 02)
ii. අමර, අම්මා, කිරියා, ටොමියා, සුරංගනාවෝ, දොස්තර මාමා (ල. 02)
iii. බෙහෙත් විදින කටුව (සිරිංජරය) (ල. 02)
iv. කිරියා, ටොමියා, සුරංගනාවෝ (ල. 02)
v. වැරදි මාවතක සිටි දරුවෙකු උපක්‍රමශීලීව හරිමඟට ගැනීම (ල. 02)

02. i. ආධුනික නළුවෙකු රංගනය පුරුදුවීම සඳහා කරනු ලබන සරල ක්‍රියාකාරකම් රංග අභ්‍යාස වේ. (ල. 02)
ii. ශිථිලකරණ අභ්‍යාස, කැඩපත් අභ්‍යාස, කටහඬ අභ්‍යාස, තාපන අභ්‍යාස, සංවේදන අභ්‍යාස, පරිකල්පන අභ්‍යාස (ල. 03)
iii. එකී රංග අභ්‍යාසයක නියැලෙන අයුරු ප්‍රායෝගිකව විස්තර කිරීම සඳහා (ල. 05)

03. i. නාට්‍යයේ ආනුශංගික කලා 02ක් නම් කිරීමට (ල. 02)
ii. වැඩි වියදම් නොවන ද්‍රව්‍ය භාවිතය, පරිසරයෙන් සොයාගත හැකි අමුද්‍රව්‍ය භාවිතය, නළු කාර්යය පහසුවිය යුතුය, නාට්‍ය පෙළට අදාළ වීම, සාමාන්‍ය ජීවිතයේ භාවිතා කරන උපකරණ වලට වඩා වෙනස් වීම ......... ආදී 03 ක් සඳහා (ල. 03)
iii. කොළපත්, ඇට වර්ග, ශාක පත්‍ර ..... ආදිය (ල. 05)

04. i. පෙර සූදානමකින් තොරව පිටපතක් නොමැතිව ක්ෂණිකවම රඟ දක්වන නිරූපණ (ල. 03)
ii. පිටපතක් නැතිවීම, පෙර සූදානමක් නැතිවීම, පෙර පුහුණුවක් නැතිවීම. (ල. 03)
iii. ඒකල : කැදර ළමයෙක්, කපටි හිඟන්නෙක්, කුඨ වෙළෙන්දෙක්, පූජකයෙක් ... ආදී
සමූහ: මඟුල් ගෙදර, මළගෙදර, බස්රථයක් තුළ, වෙළඳපලක්, පිස්සන් කොටුව (ල. 04)

05. i. චරිත හා සංවාද සහිත පෙළ නිර්මාණයට (ල. 05)
ii. කුතුහලය, ගැටුම හා අවසානය සහිත පෙළ නිර්මාණය (ල. 05)